**දිවි නැගුම අරමුදල - 2015**

------------------------------

දිවි නැගුම අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවල (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිති අංක 03 හි 07 වැනි ඡේදය ප්‍රකාරව ගනුදෙනු අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන අදාළ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුයි. එසේ වුවද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පවත්වාගෙන යන ගොඩනැඟිලි 1260 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,120,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට උපලබ්දි වූ තත්‍ය ආදායම රු. 10,387,460 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ප්‍රමිති අංක 02 හි උපදෙස්වලින් බැහැරව සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ ඇතුළත් ලැබිය යුතු ආයෝජන පොලිය රු. 34,588,038 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් වශයෙන් දක්වා තිබුණි. තවද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් නොතිබූ නමුත් රු. 742,621,040 ක මුදල් ගලා ඒමක් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

බැංකු සංගම් ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදලේ ආයෝජන කල් පිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලැබුණු රු. 16,048,183 ක් මෙම අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් හා ජංගම බැරකම් වශයෙන් දක්වා තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනය අනුව ආයෝජන සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ශුද්ධ පොළිය රු. 34,588,038 ක් වුවද, එය රු. 33,525,463 ක් වශයෙන් රු. 1,062,575 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු මුදල් ධීවර හා සත්වපාලන සහ ලැබිය යුතු කෘෂි මුදල් ශේෂයන් පිළිවෙලින් රු.10,350,042 ක් හා රු.7,480,400 ක් සම්බන්ධයෙන් උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව ශේෂය රු. 1,255,708 ක් වුවද, එය රු. 1,330,622 ක් ලෙස රු. 74,914 ක් වැඩියෙන් බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. තවද, බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි කරුණු දැක්වීමකින් තොරව මුදල් පොතේ ශේෂයට රු. 10,800 ක් එකතු කර දක්වා තිබීමද, සෘජු ලැබීම්, මුදල් පොතේ දෙවරක් සටහන් වීම් හා අගරු චෙක්පත් වශයෙන් එකතුව රු. 72,738 ක් ගිණුම් ගැලපීමට කටයුතු නොකර බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබීමද හේතුවෙන් මුදල් පොතේ ශේෂයෙහි නිවැරදිතාවය සනාථ නොවුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 වර්ෂයේදී දැයට කිරුළ වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික්ක 03ක සංවර්ධන කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබා දී තිබූ රු. 212,000,000 ක් හා සේවක ණය චක්‍රීය අරමුදලට ලබා දී තිබූ රු. 15,928,127 ක් විගණිත දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති /විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ඡේදය | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනයක් සිදුකර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 87,064,477 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 104,701,961 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 17,637,484 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම ඇතුළුව මුළු අයභාරය රු. 20,284,130 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

2013 අංක 1 දරන දිවිනැගුම (සමෘද්ධි) පනතේ 44(ආ) වගන්තිය ප්‍රකාරව දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරිවල සියලු චංචල හා නිශ්චල දේපල රජයට පවරා දිය යුතු වුවද, උඩරට සංවර්ධන අධිකාරියෙන් ලැබූ රු.16,130,842 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර අරමුදල යටතේ ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් බැහැරව ආදායම් උත්පාදන ව්‍යාපෘති හා ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති ගොඩනැඟීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම මෙම අරමුදලේ පරමාර්ථ වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර තිබුණ ද එම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 04 ක කාලපමාවකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

අරමුදල ව්‍යවස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.